**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**විශේෂ මහ සභා රැස්වීම.**
**2022.12.19**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
09. ගරු ප්රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.ඒ.ප්‍රේමාවතී මහත්මිය.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කාන්තිලතා මහත්මිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

නැත.

**සහභාගි වූ නිලධාරීන් :-**

01. ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.
02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.
03.සංවර්ධන නිලධාරී - කේ.ජී.දිනූෂා දිල්රුක්ෂි මිය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් මස 19 වෙනි දින පැවති විශේෂ මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් මස 19 වෙනි දින පෙ.ව.10.00 විශේෂ මහ සභා රැස්වීම ආරම්භ කිරිම සඳහා ගරු සභාපතිතුමා ,උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි.එහිදී ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

- **ගරු සභාපතිතුමාගේ පිළිගැනිමේ කථාව**

**ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා**

අද දින විශේෂ මහ සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුලු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි.අද දින විශේෂ මහ සභාවට පැමිණි ඔබතුමන්ලා සියළුදෙනාත් ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයත්,ඉතා ආදරයෙන් හා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. ඒ අනුව 2023 වර්ෂය සාර්ථක කර ගැනීමට සහයෝගය දක්වන මෙන් ඉල්ලා සිටිමි.

**01) 2023 වර්ෂය සඳහා සකස් කළ අයවැය වාර්තාව සහා සම්මත කිරිම.**

**ඉන්පසු ගරු සභාපතිතුමා විසින් 2023 වර්ෂයේ අයවැය පණිවිඩය ඉදිරිපත් කරන ලදි.**

2023 **වර්ෂය සඳහා වූ අයවැය පණිවිඩය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්රදේශයේ වෙසෙන ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා එහි බලතල ක්‍රියාත්මක කිරීමට ගරු උප සභාපතිතුමන් සහ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රි තුමන්ලා සහ තුමියන්ලා වෙත 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මෙසේ සභාගත කරමි.

පසුගිය වර්ෂවල පැවති මෙම බාධාවන් සැලකිල්ලට ගනිමින් අපගේ අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා අප සතු ස්ථාවර සහ ජංගම වත්කම් කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස කළමණාකරණය කරමින් නව ස්වයං උත්පාදන ආදායම් මාර්ග කරා යොමු වෙමින් බල ප්‍රදේශයේ ජනතාව අපේක්ෂා කරන මට්ටමේ සංවර්ධනයක් ඇති කිරීමට මෙවර අයවැයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇති බව මාගේ විශ්වාසයයි.

බල ප්‍රදේශයේ ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා සංවර්ධන කටයුතු සිදු කරන ප්‍රමුඛ ආයතනයක් ලෙස අපගේ මූලික ඉලක්කයන් වන්නේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ප්‍රජා සුභ සාධන කටයුතු ඇති කිරීම, දිරන නොදිරන කසල නිසි පරිදි බැහැරලීම, පාරිසරික ආරක්ෂණය සැපයිම, මාතෘ ළමා හා මහජන සෞඛ්‍ය තත්වය ඉහල නැංවීම, ආදාහනාගාර සේවාව වැනි කටයුතුයි. නමුත් ඉන් ඔබ්බට ගොස් ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම වැනි විශේෂ සේවාද අප විසින් සිදු කරනු ලබයි.

2023 වර්ෂයේ අපේක්ෂිත පුනරාවර්ථන ආදායම රුපියල් මිලියන 57ක් වන අතර මෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන්නේ වරිපනම් බදු, කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල්ය. 2022 වර්ෂයට සාපේක්ෂව මෙවර අයවැය ඇස්තමේන්තුගත කිරීමේදී මෙම පුනරාවර්ථන ආදායම ඉහල නංවා ගැනීම කෙරෙහි ප්‍රධාන බාධාවක් වන්නේ ආර්ථික අර්බුධයත් සමග ව්‍යාපාර වැසීයාමයි. නමුත් මේ වන විට රට යථා තත්වයට පත් වෙමින් පවතින බැවින් ජන ජීවිතය පියවරෙන් පියවර සාමාන්‍යකරණය වී ආයතනයෙහි බදු ආදායම ද වර්ධනය වේ යැයි අපේක්ෂා කරයි. එසේම රුපියල් මිලියන 30 ක් වූ ප්‍රාග්ධන ආදායම තුල මධ්‍යම රජයෙන් සහ සබරගමුව පලාත් සභාවෙන් ලැබේ යැයි

අපේක්ෂිත ආධාර ඇතුලත් වේ. අත්‍යවශ්‍ය නොවන සහ ගිවිසුම්ගත නොවූ සංවර්ධන කටයුතු තාවකාලිකව නවතා දැමීමට රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය මත මෙම ආදායම පෙර වර්ෂයෙහි ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු වේ යැයි අපේක්ෂිතයි. මේ අනුව 2023 වර්ෂය සඳහා අපේක්ෂිත සමස්ථ ආදායම රුපියල් මිලියන 149 කි.

එලඹෙන වර්ෂයේ අපේක්ෂිත පුනරාවර්ථන වියදම රුපියල් මිලියන 50 ක් වන අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 10 ක පමණ වැඩිවීමකි. භාණ්ඩ හා සේවා මිල සහ ඉන්ධන මිල ගණන් අධික ලෙස ඉහල යාම මෙම වැඩිවීමට ප්‍රධාන සාධකය වී ඇත. තවද 2023 වර්ෂය සඳහා අපේක්ෂිත සමස්ථ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 37ක් දක්වා, එනම් රුපියල් මිලියන 24 කින් පමණ අඩු වී ඇත. ඒ අනුව අපේක්ෂිත සමස්ථ වියදම රුපියල් මිලියන 149 කි.

මෙවර අයවැයේදී මුහුණදීමට සිදුවූ ප්‍රධානතම ගැටළුව වූයේ 2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ ආදායම හා සැලකීමේදී සමස්ථ වියදම කැපී පෙනෙන ලෙස ඉහල යාමයි. ආයතනයෙහි දෛනික අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් මෙලෙස අධික වියදමක් දැරීමට සිදුවීම බල ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් වෙන්කල හැකි ප්‍රතිපාදන අඩු වීමට සෘජුවම බලපා ඇත. මේ හේතුව මත ස්වයං උත්පාදන නව ආදායම් මාර්ග කෙරෙහි යොමු වීම ඉතා වැදගත් සහ කාලෝචිත අවශ්‍යතාවයකි. මේ පිලිබඳව අවධානය යොමු කරමින් 2022 වර්ෂයේ අයවැයේදී සභාවේ අධීක්ෂණය යටතේ බ්ලොග් ගල් නිෂ්පාදන කර්මාන්තායතනයක් ඇරඹීමට යෝජනා කර තිබුනද රට තුල උද්ගතව තිබූ අයහපත් තත්වය මත එම ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. ඒ පිලිබඳවද සැලකිලිමත් වෙමින් ගරු මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා පරිදි අවම ප්‍රාග්ධන ආයෝජනයකින් ඇරඹිය හැකි ආදායම් උත්පාදන මාර්ග වෙත කඩිනමින් යොමු වීම සංවර්ධන කටයුතු සිදු කිරීම හා සමගාමීව සිදු කිරීමට අවධානය යොමු කර ඇත. ඒ වෙනුවෙන් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේත්, ලේකම්තුමා ඇතුළු නිළධාරී මණ්ඩලයේත් කැපවීම සහ සහයෝගය පෙරටත් වඩා ඉදිරි වර්ෂයේදී අපේක්ෂා කරමි.

තවද 2022 වර්ෂයේ මුහුණදුන් අභියෝග ජය ගනිමින් 2023 වර්ෂය සාර්ථක කර ගැනීම උදෙසා අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, සබරගමුව පලාත් ගරු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමා, පලාත් සභා හා පලාත් පාලන ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා, හිටපු ගරු සෞඛ්‍ය අමාත්‍ය, රත්නපුර දිස්ත්‍රික් නායක, නීතීඥ පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය ඇතුළු රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන්, සබරගමුව පලාත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්, සබරගමුව පලාත් පාලන කොමසාරිස්තුමා සහ සහකාර කොමසාරිස්තුමා ඇතුළු සියලුම නිළධාරින්ගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

ලබන්නා වූ 2023 වර්ෂය මාගේ බල ප්‍රදේශයේ සහ මුළු මහත් ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත් අපේක්ෂාවන් ඉටුවන සියලු අභියෝග ජය ගත හැකි වන නිදුක් නිරෝගී වාසනාවන්ත වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>

ඒ අනුව, 2023 වර්ෂයට අදාළ අයවැය වාර්තාව සභා සම්මත කිරිම සඳහා මහ සභාවට ඉදිරිපත් කර සිටිනවා.2023 වර්ෂයේ අයවැය සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා. 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කළා. එය සභා සම්මත උනා. අපි ගිය වර්ෂයේත් අයවැය සභාවට ඉදිරිපත් කරලා, අයවැය ජයග්‍රහණය කරලා,ඒ තුළින් ඇඹිලිපිටිය සහා බල ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් කිරිමට බලාපොරොත්තු උනා. නමුත් ලෝකයේ ඇති වූ කොවිඩ් වසංගතය ලංකාවටත් ඒ වගේම අපිටත් බලපෑ නිසා ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාව විසින් බලාපොරොත්තු වූ සේවාවන් ජනතාවට ඉෂ්ට කරන්න අවස්ථාවක් උදා වුනේ නැහැ.ඒ තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ සභාපති තුමා ,මන්ත්‍රිවරු, ජනතාව සියළුම දෙනා මහත් අපහසුතාවයට පත් උනා. නමුත් අපි සියළු දෙනාම ජිවත්වීමේ

වාසනාව උදාකර ගත්තා. රටේ ජනතාවට මෙන්ම බල ප්‍රදේශයේ ජනතාවටත් ජීවත් වීමේ අවස්ථාව ලබා දිම පිළිබඳව අපි සතුටු විය යුතුයි.ඒ වගේම බල ප්‍රදේශයේ ජනතාව ප්‍රාදේශිය සභාවේ ආර්ථිකයට යම්කිසි දායකත්වයක් ලබා දුන්නා. 2023 වර්ෂය සඳහා, ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවට සෙත සැලසිමේ අරමුණින් බලාපොරොත්තු රාශියක් ඇතිව ඉතාම වැදගත් අයක් සහ වැයක් ඔබතුමා හා නිළධාරි මණ්ඩලය ඉදිරිපත් කර තිබෙනවා. අපි අපේක්ෂිත ආදායම බිලියන 149 ක්. ඒ තුළ පුනරාවර්ථන ආදායම මිලියන 57ක්. ප්‍රාදේශිය සභාවේ කාලසීමාව අවසන් වෙමින් පවතින මොහොතක තමයි අපිට ලබන වසර සඳහා මේ අයවැය සභාවට ඉදිරිපත් කරන්න වෙලා තියෙන්නේ. මම හිතන්නේ මේක අපේ අවසාන සභාව වෙන්නත් පුළුවන්. සමහර විට ලබන මාසය වන විට සභාව විසුරුවා හැර මාර්තු මාසය වන විට ඡන්දයක් පවත්වලා නව මහජන නියෝජිතයින් පිරිසක් එන්නත් පුළුවන්. ඒ කෙසේ වෙතත් අපි ජනතාවට සේවාවක් සිදුකළ හැකි හොඳ අයවැයක් ඉදිරිපත් කරලා තිබුණාම, ඒකේ ගෞරවය අපිටත් හිමිවෙනවා. ගිය වසරේ සභාව තුළින් බ්ලොක් ගල් ව්‍යාපාරය ආරම්භ කරලා සභාවේ අළුත් ආදායම් මාර්ගයක් උත්පාදනය කරලා, ඒ තුළින් ජනතාවට මෙහෙවරක් කරන්න අපි බලාපොරොත්තු වුණා. නමුත් රටේ ඇති වුණ ඒ අයහපත් තත්ත්වය නිසා අපට ඒ දේ කරන්න බැරි උනා. නමුත් ඉදිරියේදි හෝ ඒ බලාපොරොත්තු වූ නව ආදායම් මාර්ග සකසා ගෙන ජනතාවට වඩාත් ඵලදායි සේවාවක් කරන්න, සභාව නියෝජනය කරන සභාපති වරුන්ට මන්ත්‍රිවරුන්ට අවස්ථාව උදාවේවායි මම ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී සීතා පද්මිණී මහත්මිය.</u>**

ගරු සභපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි.එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අභිවනයෙන් අප සභාවට තේරී පත් වූ ප්‍රේමා වනිගසිංහ මන්ත්‍රීතුමිය ඉතාම ආදරයෙන් පිළිගන්නවා. ඒ වගේම එතුමියට ඉදිරි කටයුතු කරගෙනයාමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. අද දින ගරු සභාපති තුමා විසින් 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කලා. උප සභාපති තුමා කිව්ව වගේ ලබන අවුරුද්ද වන විට අපි මේ සභාවේ සිටින්නත් පුළුවන්. නොසිටින්නත් පුළුවන්. ඒ හිටියත් නැතත් බොහොම සතුටුයි. මොකද ඔබතුමා ඉතාමත් සාර්ථක අයවැයක් ඉදිරිපත් කලා.ඒකට බොහෝම ස්තුතියි. ඒ වගේම ගරු සභාපතිතුමා ඇතුළු මගේ සහෝදර මන්ත්‍රී මණ්ඩලයටත්, හැමදාම අපි වෙනුවෙන් කටයුතු කරන අපේ ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත්, ඉදිරි කටයුතු ඒ ආකාරයෙන්ම සාර්ථක කර ගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවා. ලැබුවා වූ 2023 නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ගමන් ඔබ සියළු දෙනාගේ සිත්වල තිබෙන ප්‍රාර්ථනා ඉටුවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමණි,ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමත්ලාගෙන් අවසරයි. උප සභාපතිතුමා කිව්වා වගේ ගිය වසරේ අපි බලාපොරොත්තු වුණ ඉලක්කවලට යන්න බැරි උනේ රටේ පැවති අර්බුදකාරි තත්ත්වය සහ වසංගත තත්ත්වය නිසා. අපේ ආදායම අහිමි වුණා.සතිපොළවල් හරියට පවත්වන්න බැරි උනා. බලාපොරොත්තු තිබුණා.ඒ නව ආදායම් මාර්ග උත්පාදනය කරන්න.ඒ සඳහා අපි යෝජනා කිහිපයක්ම ගෙනාවා. සංචාරකයින්ගේ සිත් ගන්නා ස්ථාන ලෙස උඩවලව, පනහඩුව, පනාමුර වගේ හඳුනාගත් ස්ථාන වැඩි දියුණු කරලා ආදායම් මාර්ග වැඩි දියුණු කරලා ජනතාවට වඩාත් ඵලදායී සේවයක් කරන්නට ගරු සභාපති තුමා ඇතුළු සියළු දෙනා වැඩපිළිවෙලක් හදාගෙන ආවා.එහි ඉලක්කයන් සපුරා ගන්න බැරි උනත් 2023 වර්ෂ සඳහා අපි ඉදිරිපත් කළ ආදායම් වියදම් ඇස්තමේන්තුව තුළින් විශාල වැඩ කොටසක් කර ගන්න හැකිවේයැයි මම විශ්වාස කරනවා. අපේ සීතා මන්ත්‍රි තුමිය හා අපේ උප සභාපති තුමා කිව්ව වගේ මේ අපේ අවසාන සභා වාරය වෙන්නත් පුළුවන්. ඡන්දයක් තිබුණොත් මන්ත්‍රී මණඩලය මීට වැඩිය අඩුවෙයි.කෙසේ වෙතත් ඒ සියළුදෙනාට මේ කටයුතු සාර්ථක කර ගන්න ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා කියල මම ප්‍රාර්ථනා කරනවා.මේ මට්ටමින් හරි ප්‍රදේශයේ ජනතාවට සේවයක් කරන්න විශාල උත්සාහයක් කැපකිරිමක් කළ ගරු සභාපති තුමා, උප සභාපති තුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රිවරුන්ට මාගේ ගෞරවය ස්තුතිය පුද කරනවා. මේ අවුරුද්දේ පවත්වන අවසාන සභාව. ගරු සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම් තුමා ඇතුළු සියළු කාර්යය මන්ඩලයටත් 2023 වර්ෂය සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>**

ගරු සභාපතිතුමණි, සියළුම දෙනාට සුභ නව වසරක්. 2023 වර්ෂය සදහා ඔබතුමා ඉදිරිපත් කරනු ලැබූ අයවැයට මම සුභ පතනවා. මොකද අපට පසුගිය වර්ෂවල ඉලක්ක ගත අරමුණුවලට යන්න බැරි උනා. ඒ සඳහා යම් යම් කාරණා තිබුණා.ඒ කාරණා නිසා අපට 100% අරමුණුවලට යන්න බැරි උනාට අපි පුළුවන් ප්‍රමාණයට, ඔබතුමාගේ දායකත්වය සහ අපේ කැපවීම තුළින් ප්‍රදේශයේ ජනතාවට මහජන සෞඛ්‍ය උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් යන කරුණු පරිපාලනය කරලා යම් සේවයක් කළා.ඒ කටයුතු අපට හැකි ආකාරයෙන් හෝ කරන්න ලැබිම පිළිබදව සතුටු වෙනවා. ඒ වගේම මෙම අයවැයේදි අපට දකින්න පුළුවන්, 2023 වර්ෂය සඳහා අපිට ප්‍රාග්ධන ආදායම පිළිබදව මහ ලොකු විශ්වාසයක් නැතත් පුනරාවර්ථන වියදම් පිළිබදව විශ්වාසය තබා ගෙන කටයුතු කිරිමට හැකියි. වරිපනම් බදු,කුලි සහ ඒ අයකිරිම් ,උසාවි දඩ,මුද්දර ගාස්තු වගේ කාරණා වලින් මෙම සල්ලි ලැබෙන්නේ.යම්කිසි හෙයකින් අපිට ප්‍රාග්ධන ආදායම ලැබුණා කියලා පුනරාවර්ථන වියදම් සඳහා යෙදවීමට හැකියාවක් නැහැ.ඒ නිසා අපි ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කල යුතුයි.අපි දන්නවා, රටේ ආර්ථික ප්‍රශ්නයක් තියනවා .අපි ඒ ප්‍රශ්නවලට මුහුණ දෙමින් යනවා.ඒ ප්‍රශ්න නිරාකරණය කරගෙන යම් කිසි සහනදායි වැඩ පිළිවෙලක් ඇති කළ යුතුයි.එහිදි විශේෂයෙන්ම ගරු සභාපතිතුමා සඳහන් කළා, ඒ වගේම උප සභාපතිතුමා, ගරු මන්ත්‍රිවරු සියළු දෙනා ප්‍රකාශ කලා, නව ආදායම් උත්පාදනවලට යා යුතුයි කියලා .ඒක ඉතාමත් වැදගත් කාරණයක්. මොකද අපි මුලින්ම මේ සභාවට ආපු කාලයේදි මට මතකයි මම යෝජනා කළා, අවමංගල සේවාවක් ආරම්භ කරන්න. වර්ථමානයේ තියෙන මල් ශාලාවල ගණන් ගත්තම අපට පුළුවන් සහනදායි විදියට ඒ කටයුතු කරලා ආදායමක් ලබාගන්න.මේ සඳහා ස්ථානයක් තියනවා, සුසන්ත මන්ත්‍රිතුමාගේ කොට්ඨාශයේ.ඒ අපේ උඩවලව ආදාහනාගාරය. ඒ කාලයේදි මම මේ යෝජනාව ගෙනාවා. නමුත් ඒවා ක්‍රියාත්මක උනේ නැහැ.තව අපිට තියනවා ගොඩනැගිලි. ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගන්න තියෙන්නේ.තව ටියුෂන් පංති විශාල ප්‍රමාණයක් බල ප්‍රදේශයේ තියෙනවා. . ඒ ගුරුවරු විශාල ආදායමක් ලබනවා.ඒවා පරිපාලනය කරලා, අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරලා ආදායමක් ලබා ගන්න අපට පුළුවන්. තව තියනවා අපි නොදකින පැත්තක්. ඒ අපේ බල ප්‍රදේශය තුළ ලොකුවට චැනල් සෙන්ටර් නොතිබුනාට වෛද්‍යවරු ඇවිත් රෝගින්ට ප්‍රතිකාර කරන ස්ථාන විශාල ලෙස තිබෙනවා. ජනතාව විශාල වශයෙන් පුද්ගලික අංශය තුළින් බෙහෙත් ගන්නවා. එම ආයතන නියාමනය කරලා, ඒ වගේ බදු අයකර ගන්න, අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගන්න අපට හැකියාව තිබෙනවා.ඒ වගේම තව කාරණයක් තියනවා. ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය කියන්නේ විශේෂයෙන්ම නාගරික ප්‍රදේශය කිහිපයක් හැරුණු කොට කෘෂිකාර්මික ප්‍රදේශයක්. ඒ කෘෂිකාර්මික ප්‍රදේශ වල සෑම ගොවි මහතෙක්ම දැන් හුරුවෙලා තියෙනවා නළ ළිදක් ගැසිමට.මේ සඳහා ලක්ෂ දෙක තුනක් වියදම් වෙනවා. ඒ ආයතන හෝමාගම, කුරුණෑගල වැනි දුර බැහැර ප්‍රදේශවල ඉඳන් ඇවිත් විශාල ආදායමක් ඒකරාශි කරගෙන යනවා.අපි ඒ ආයතන නියාමනය කරලා,දැනුවත් කරලා ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් නිර්මානය කරලා, ස්වයං ආදායම් උත්පාදන මාර්ගයකට පැමිණෙන්න පුළුවන්. පුනරාවර්ථන වියදම සමබර කරලා විචල්‍ය මුල්‍යය ප්‍රශ්ණයක් නැතිව කරගෙන යන්න ඔබතුමා මේ සභාව ප්‍රශ්නයක් නැතිව කරගෙන ගියා. නමුත් අයවැය පරතරය අවම කර පරිපාලන කටයුතු පරිපාලන නිළධාරියා හැටියට ලේකම් මහතාත් විධායක නිළධාරියා විදියට ඔබතුමාත් ඒ කාර්යය ඉෂ්ඨ සිද්ධ කලා. ඒ වගේම දිගින් දිගටම අදහස් දක්වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද මන්ත්‍රිවරුන්ගේ අදහස් වලින් කියවුනා මේ අවසන් සභාව වෙන්න පුළුවන් කියලා. රටේ තියන තත්ත්වය එක්ක මේ වේලාවේ ප්‍රාදෙශිය මැතිවරණයකට යනවනම් රු.කෝටි 10000 ක් වත් වියදම් වෙනවා කියලා මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරලා තියනවා.මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ පළාත් සභා අක්‍රිය වෙලා තියනවා වගේ ප්‍රාදේශිය සභා අක්‍රිය නොවි ප්‍රජාතන්ත්‍රවාදි නියෝජිතයන්ගේ හඩ ඉස්මතු වන ආකාරයට කොමසාරිස් පාලනයකට යටත් නොවි සිටින සභික සංඛ්‍යාව අඩු කරලා හෝ ජාතන්ත්‍රවාදි පාලනයකට යායුතු බවයි. ගරු සභපති තුමාට හා සියළු මන්ත්‍රි මණ්ඩලයටත් ලේකම් තුමා ඇතුළු නිළධාරි මණ්ඩලයටත් ලැබුවාවු 2023 වර්ෂය සුභ නව වසරක් වේවායි ප්‍රාර්තනා කරමින් මම නිහඩ වෙනවා ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි එල්.ඒ. කාන්තිලතා මිය</u>**

ගරු සභාපතිතුමණි, 2023 සදහා ඉදිරිපත් කරන ලද අයවැය සම්බන්ධව බෙහෙවින්ම ස්තූතියි. 2022 වර්ෂයේ ඉදිරිපත් කල අයවැය අංග සම්පූර්ණ නොවුනත් නැවත 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කල අයවැය සම්බන්ධ ව මට ප්‍රශ්ණයක් තියෙනවා. ප්‍රාග්ධන ආදායම් සාරාංශය යටතේ ප්‍රාග්ධන ආදායම විදියට කෝටි 12ක් තියනවා. ගිය අවුරුද්දෙත් මේ විදියටම තිබුණා. භෞතික සැලසුම්, මංමාවත් හා ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිය සැරේ වෙන් කළ මුදල කොට්ඨාශ මන්ත්‍රිවරුන්ගෙන් බෙදුවම එක මන්ත්‍රිවරයෙකුට ලක්ෂ 63 වගේ තමයි සැලසුම්

කරලා තියෙන්නේ. ආධාර විදියට ගිය වසරේ මුදල් ලැබුණේ නැහැ කියලා සඳහන් වුණා. මේ අවුරුද්දෙත් මේ සඳහා ඉදිරිපත් කර ඇති විදයම තුන්කෝටි විසි එක්ලක්ෂ එකොලොස් දහස් නවසීහ හතලිස් හතරක්. අපිට මේ අවුරුද්දේ එනම් මේ අයවැය ඉදිරිපත් කර ඇති ආකාරයට ලබන අවුරුද්දෙ මෙය අපේක්සා කල නොහැකි අතර එම අධාර ලැබුනොත් කොට්ඨාශයේ මන්ත්‍රීවරුන්ට 124329.32 වගේ මුදලක් තමා එන්නේ, සංවර්ධන කටයුතු සඳහා එක් අයෙකුට. අනෙක් එක සභාපතිතුමා සභාවට ඇවිත් 5 වන අවුරුද්ද මේ. පලවෙනි අයවැයේ සඳහන් වේච්ච ආකාරයටම තමා මේකෙත් බැලුවොත් සංවර්ධන කටයුතු සඳහන් වෙන්නේ. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නිරවුල් විය යුතු නිරවුල් නොවූ සුසාන භූමි රාශියක් තියෙනවා., කුට්ටිගල,පදලංගල සුසාන භූමිය විතරක් නිරවුල් කර ගත්තා.තව සභාව සතු උදව් ගන්න ඕනි සතිපොලවල් තියනවා. ඒ වගේම ප්‍රජා ශාලාවල් පිළිබඳව අවධානය යොමු කිරීමට අවශ්‍යයයි.අපි මන්ත්‍රීවරු විදියට අපේ කොට්ඨාශ ගැන අපට සෑහීමක පත් විමට පුළුවන් කමක් නැහැ, මෙතෙක් සිදු වූ කාරනා සම්බන්ධව. අපි ප්‍රාර්ථනා කරමු ලබන වසර කවුරු පත් උනත් ෙමික අපි හැමෝගෙම අයිතියක් නෙමෙයි. මෙය පොදු ස්ථානයක්. මැතිවරණයෙන් කවුරු බලයට පත් වෙයිද අපි දන්නේ නැහැ. කවුරු බලයට පත් වුනත් මේ කාර්යය න් සාර්ථක කර ගැනීමට වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරනවා හදවතින්ම. මේ අවුරුදු 05 තුල බහු ජන නායකයින් විදියට සභාවෙන් ලැබිය යුතු කිසිවක් නොලැබුනු නිසා ඒ ගැන කම්පනයක් තිබෙනවා, අපට මහජන නියෝජිතයො විදියට. නමුත් ඉදිරි කටයුතු සාර්ථක වේ යැයි මම ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායන මහතා</u>

සභපති තුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි **2023 වර්ෂය සඳහා අයවැය ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කළා. මට හිතෙන්නේ මීට පෙර සියළුම වර්ෂවල වගේ ඉතාමත් බලාපොරොත්තු සහගත අයවැයක් තමා ඉදිරිපත් කලේ. නමුත් පසුගිය කාලසිමාව තුළ විශේෂයෙන්ම අවුරුදු 04 තුල අපි බලාපොරොත්තු වුන තැනට යන්න බැරි උනා.ගොඩාක් බලාපොරොත්තු තියාගෙන තමයි මේ අයවැයක් ඉදිරිපත් කරන්නේ.මේ කටයුතු වලදි හැමදාම කථා කරනවා,විවේචනය කරනවා. නමුත් අපි හැමදාමත් හිටියේ පොදු මතයක. සභාවක් වශයෙන් හොද දෙයක් කරමු.ජනතාවට සුභවාදි වැඩපිළිවෙලකට යමු කියන තැන. නමුත් දැන් මිනිසුන් අතර රජය ගැන තියෙන්නේ, තමන්ට මොනවා හරි සුභ සාධනයක් ලැබෙයි කියන අදහස. නෙමෙයි හැමදාම මිනිස්සු අතර භිතියක් තියනවා, මොන ආකාරයෙන් තමන් පිඩාවට පත්කරයිද කියලා.මහජන නියෝජිතයින් වශයෙන් මිනිසුන් අතර අපි පිළිබදවද දැන් විශ්වාසයක් නැහැ.** මේ අවස්ථාවේදී අපි මහජනතාවට යම් සහනයක් දෙන්න, අපේ ආදායම් පැත්ත වැඩි කර ගන්න ඕන. නමුත් සභාවට ආදායමක් නැතිව මිනිස්සුන්ට සහනයක් දෙන්න යන්න බැහැ. අපි මේක ඇතුලේ හැමදාම ජනතාවට සහන සලසන්න කියලා මුදල් වෙන් කරනවා. රු 10,000.00 ක් අසරණ මිනිස්සුන්ට රෝගයක් වැලදුනාම බෙහෙත් ගන්න දෙන්න බැරි නම්, අපිට අවශ්‍ය කරන පොදු කටයුත්කකදී යම් සහනයක් ,සහනාධාරයක්,ටකරන් කොලයක් නැති නම් සිමෙන්ති කොට්ටයක් දෙන්න ගියාම නිළධාරි එක්ක තර්ක කරලා, කොමසාරිස්තුමාගේ අනුමැතියට යවලා, ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. අපිට මේවා ස්වයංව කර ගෙන යන්න විදියක් නැහැ.අපි දැන් මේ අය වැය තුලත් සුභ සාධන කටයුතු කරන්න කියලා සල්ලි වෙන් කරනවා. නමුත් මේ සියළුම දේවල් ලේඛනවලට පමණක් කොටු වෙලා. ඇත්තම දේ අපි කවුරුවත් මෙතන වර්ෂ අවසාන අයවැය කියලා ඉදිරිපත් කළාට අපි කවුරුත් දන්නවා මේක ප්රායෝගික නැහැ.විශේෂයෙන් මේ ලේඛණයේ පිටු පෙරලද්දී පසුගිය වර්ෂවල සමහර දේවල් ඒ ආකාරයන්ම මේ පොතට ඇවිත් තියෙනවා. ඒකට සරල උදාහරණයක් කියන්නම්. මේ ලේඛණයේ මගේ දුරකථන අංකය විදියට මීට අවුරුදු 10 ක ට කලින් සභාවට දිපු තමයි යොදලා තියෙන්නේ.ඒක මම කිහිප විටකදීම වෙනස් කළා.නමුත් ඒ අංකයමයි මේ දක්වාම තියෙන්නේ. දුරකථන අංකය මාරු කරලා අවුරුදු 05 ක ට වැඩි යි. ඒ නිසා යම් යම් පිටු ඒ අකාරයෙන්ම මෙයට ඇතුලත් වෙලා තියෙනවා. ගරු සභාපතිතුමා පසුගිය අවුරුදු 05ක කාලය තුළ දේශපාලන භේදයකින් තොරව සියළුම දෙනා එක්ක ඒකරාශි වෙලා සභාව ගොඩ දාන්න සැහෙන්න උත්සාහ ගත්තා. නමුත් පසු ගිය වසර දෙක තුළ ආපු ස්වාභාවික උවදුරු එක්ක මට හිතෙන්නේ සභාපතිතුමාට නෙමෙයි කිසිම කෙනෙකුට යම් ආකාරයට දේශපාලය අධිකාරිය වෙනුවෙන් දෙයක් කරන්න පහසු උනේ නැහැ. සංවර්ධන කටයුතු වේවා ,විථි ලාම්පු වේවා කිසිම දෙයක් ඉල්ලනේ නැතුව, අපි පසු ගිය වර්ෂවල කණ්ඩායමක් වශයෙන් ඕනෑම තීන්දුවකට ගරු කරලා, පුළුවන් ආකාරයට අපි මේ සභාව කරගෙන ගියා. විශේෂයෙන්ම නගර සභාව කියන්නේ කෝටි ගණන් වත්කමක් ඇති ස්ථානයක්. නමුත් එය මේ වන විට පඩි ගෙවා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා. නමුත් අපේ සභාව හිටියේ ඊට වැඩිය පොඩ්ඩක් පහලින්. නමුත්

අපේ ගරු සභාපතිතුමා නගර සභාවේ තත්ත්වයට යන්න නොදී අපේ සභාව රැක ගත්තා. ඒ ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම තමයි ප්රාදෙශීය සභාව තුල කටයුතු කිරිමෙදී දේශපාලන භේදයකින් තොරව අපි සියළු දෙනා ඒකරාශීව කටයුතු කලා. හැබැයි ඉතින් අද රටේ තියෙන වාතාවරණය අනුව දවසින් දවස රට යන අත බැලුවම අපි මොන අකාරයෙන් ලියකිවිලි සම්පුර්ණ කරලා අංක ගණිතයෙන් ගැලපුවත්, ඒවා ක්‍රියාත්මක කිරිම බොහොම අසිරු කාර්යයක්. ඒක ඉදිරියට ඔබතුමාට වෙන්න පුළුවන්. ගරු උප සභාපතිතුමාට වෙන්න පුළුවන්. නැත්නම් අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන්ට වෙන්න පුළුවන්. කවුරු අතට ගියත් අපි අපට ලැබෙන ආදායම අනුව ගන්නා උත්සහය අනුව තමයි ගමන යන්න වෙන්නෙ. ඒ ගන්න උත්සාහය ගැන සභාපතිතුමා ඇතුළු නිලධාරි මණ්ඩලයට බෙහෙවින්ම ස්තිතුවන්ත වෙනවා. ලබන වසර තුළ අපි යම් දෙයක් ගොඩ නගා ගන්න උත්සහ කරනවා. අපි ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු වශයෙන් මේ සහභාගි වන අවසාන සභාව වෙන්නත් පුළුවන්. අපිට සමහර විට පළාත් සභාව වගේ කවදාවත් මැතිවරණයක් නැති වෙන්නත් පුළුවන්. මොකද දේශපාලනය කියන්නේ අපි හිතන විදිය නෙමෙයි. දවසින් දවස වෙනස් වෙනවා. අපි සියළු දෙනාටම පසුගිය කාල සිමාව තුළ දේශපාලන බලාරොත්තු තිබුණා.ආපසු ඡන්දේ ඉල්ලන්න ඕන, කියලා.මුළු මහත් ප්‍රාදේශීය දේශපාලඥයින් මේ වන විට පක්ෂ භේදයකින් තොරව කල කිරීමෙන් තමයි පසුවෙන්නේ. ඒ නිසා ඊලග මැතිවරණය වන විට ඡන්දේ ඉල්ලන්නේ නැතුව ඉන්නත් පුළුවන්. කෙසේ උනත් ඊලග සභාව තුල මේ අයවැය ක්‍රියාත්මක කරලා සාර්ථක ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවක් නිර්මාණය කරගන්න ශක්තිය ලැබේවායි ප්‍රාර්ථන කරමින් සියළුම දෙනාට සුභම සුභ නව වසරක් වේවයි සුභ පතනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්රි අමිත් රණතුංග මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම් තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයෙන් අවසරයි. 2023 සඳහා ඉදිරිපත් කළ අයවැය සම්බන්ධයෙන් සියළු මන්ත්‍රීවරුන් අදහස් දැක්වූවා. 2018 පළාත් පාලන මන්ත්රිවරයෙක් ලෙස ඇඹිලිපිටිය ප්රාදේශීය සභාවට ඇවිත් සමහර විට මේ අවසාන අයවැය වෙන්න පුළුවන්. 2023 අයවැය සම්බන්ධව කතා කිරිමේදී රු: කෝටි 58 පමණ අදායමක් අපි ලබන කොට, ඒ තුල වරිපනම්,කුලි ආදායම්,බලපත්ර ගාස්තු,මුද්දර ගාස්තු ,උසාවි දඩ මුදල් ඇතුලත් අයවැයක් තමයි 2018 දිත් මම දැක්කේ.2022 දීත් අවුරුදු 4ක් ආපස්සට හැරිල බැලුවම අපි පෙර දේමයි කරල තියෙන්නේ. මම හිතන්නේ කිසිම නව ආදායම් මාර්ගයක් ලබා ගන්න ක්‍රම වේදයක් ,ස්ථායි ආර්ථිකයක් හදන ක්‍රමයක් ප්රාදේශීය සභාව තුල හදල නැහැ. ඒ නිසා සතුටු දායක මට්ටමක නැහැ. මෙම අයවැය සම්බන්ධයෙන් විශේෂයෙන්ම සරත් මන්ත්රීතුමා කතා කරා වගේ නව ආදායම් මාර්ග විශාල වශයෙන් ඇති කර ගන්න පුළුවන් සභාවක් තමයි, ඇඹිලිපිටිය ප්රාදේශීය සභාව .රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම මම හිතන්නේ ආර්ථික කේන්ද්‍රස්ථානය තමයි ඇඹිලිපිටිය.අපි මේව කතා කළොත් යම් කිසි හිත් අමනාපකම් ඇති වෙන්නත් පුළුවන්. ඒවගේ දේවල් සිදුවන නිසා ඉවසලා ඉවසලා බැරි තැන කතා කරන්න වෙනවා. ඒ නිසා මම හිතන්නේ කෘෂිකර්මාන්තය පිළිබදව අපි කතා කලොත් විශාල වශයෙන් කෘෂිකර්මාන්තය තියෙනවා. මේ රටට බත සපයන වී, සම්බන්ධව අපි කතා කලොත්, සභාවට විශාල වශයෙන් ගොවීන්ගේ වී ටික අපි අරගෙන නැවත ජනතාවට සහන මිලකට ලබා දෙන්න පුලුවන්. ඒ වගේම කැලි කසල සම්බන්ධව කතා කලොත් 2018 හිටපු සභාපතිතුමා සමග අපි ගියා අම්පාරේ කසල කළමණාකරණය කරන ස්ථානයක් බලන්න. නමුත් අපි බලලා විනෝද වෙලා ආවා. ජනතාවට සේවයක් උනේ නැහැ. අපස්සට හැරිලා තමගේ හදවතට තට්ටු කරලා බැලුවොත්, සතුටු තත්වයෙන් කවුරුවත් නැහැ. පක්ෂ ආරක්ෂා කරන මුවාවෙන් අප සියළුම දෙනා පක්ෂය ගන්න තීන්දු සමග ඉන්න උන නිසා ජනතාවගේ පැත්තේ තීන්දු තීරණ ගන්න අපිට බැරි උනා. ඒ ගැන කනගාටු වෙනවා. මේ විථි ලාම්පුවක් සවි කළා,මාර්ගයක් ඉදිකලා කියලා ඒ සභාවේ අපි වැඩක් කළා නෙමෙයි. අපි ඊට වඩා දෙයක් කරන්න ඕන. මිනිසුන්ගේ අවශ්‍යතාවය මේ විථි ලාම්පු සවි කරන එකවත්, පාරක් හදන එකවත් නෙමෙයි. ගරු සභාපතිතුමණි,අපෙන් විය යුතු සේවාවන් ඉෂ්ඨ උනේ නැහැ. මේ මන්ත්‍රීවරු 29 දෙනා ගැනම තීන්දු තීරණ ගන්න වෙනවා, ජනතාවට.සභාවේ සතිපොලවල් ගත්තොත් ගරු සභාපතිතුමා සතිපොලවල් 07 තියෙනවා. මම මේකෙ බැලුවා, පල්ලේබැද්ද සතිපොල ගත්තාම මිලියන එකයි ලක්ෂ අනූනවදාහක්. උඩවලව පොල 315,000ක්. ඒ වගේම කොළඹගෙආර තුංකම ,42,මුල්ඇඩියාවල සතිපොල තියනවා. සම්පූර්ණ ආදායම මිලියන 7 ක් බලාපොරොත්තු වෙනවා. මට මතකයි ගිය පාර පනාමුර,කොළඹගෙආර සති පොලවල්වල සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කළා. නමුත් අපි එතන නෙමෙයි ඉන්න ඕන. අපි අර පරණ ලිං මැඩි දේශපාලනය තවමත් කරන්නේ. මෙය වෙනස් කරන්න ඕනි කාලය ඇවිත් තියෙන්නේ. අපි පල්ලෙබැද්ද සතිපොලට ලක්ෂ 10 ක් වෙන් කළා. ඒ කොට්ඨාශෙ මන්ත්රිවරයා සතුටු කරනවාට වඩා මම හිතන්නේ අවුරුදු 04 ට සති පොලවත් 4 ක් නිර්මාණය කරනවා කියන බලාපොරොත්තුවෙන් එක සතිපොලකට ලක්ෂ 50ක් 60ක් වෙන් කළා නම් සාර්ථක සතිපොලවල් 4 ක් දකින්නට ලැබෙනවා. මේ වසර 4 ඇතුලත අපි මේ මොකද්ද කළේ කියලා හදවතට එකගව කල්පනා කරලා

බලන්න. ඒ වගේම ක්‍රීඩා පිටි ටික ගත්තාම අපිට නිරවුල් කරගන්න බැරි උනා. ඒ ක්‍රීඩාපිටිවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න බැරි උනා. අපි මොනවද කළේ කියලා හිතෙනවා. ඒ නිසා දෙවරක් නෙමෙයි තෙවරක් හිතා බලා මීට වඩා පක්ෂවල ගන්න තීරණවලට වඩා තමන්ගේ හෘද සාක්ෂියට අනුව තීරණ ගත්තොත් මීට වඩා සාර්ථක අනාගත ප්‍රාදේශීය සභාවක් නිර්මාණය කරන්න පුළුවන්. ඒ නිසාවෙන් ගරු සභාපතිතුමා ඉදිරිපත් කල අයවැය සම්බන්ධයෙන් මම සතුටුදායක මදට්ටමක නැහැ. ඒ නිසාවෙන් නිරත්තරයෙන්ම මේ සභාවේ 2023 අයවැයට විරුද්ධ වෙනවා. ඒ වගේම ඔබතුමා ගෙනයන වැඩ පිලිවෙල ඉදිරියට කරගෙන යන්න ඔබතුමාට සහයෝගය මේ මන්ත්‍රීතුමන්ලාගෙන් ලැබෙන නිසා ඉදිරි කටයුතු සාර්ථක කර ගැනිමට සුභ පතනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. නන්දසේන මහතා</u>**

ගරු සභාපතිතුමාගේ අයවැය ඉලක්කම්වල තියෙනවා පෙරපාසල් සංවර්ධනය කිරිම විධිමත්ව පවත්වා ගෙන යාම තුලින් බල ප්‍රදේශයේ දරුවන්ගේ ජීවන තත්ත්වය සංවර්ධනය කිරිම සඳහා අනුබල දීම ලෙස. ඇත්තටම මුලින්ම ප්‍රාදේශීය සභාවෙන් ප්‍රදේශයට වෙන්න ඕන කාරණා සම්බන්ධයෙන් මුලික කාරණා විදියට දැක්කේ අන්න ඒ කාරණාව තමයි. හැබැයි මේ අයවැයෙන් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තියෙන මුදල් එක්ක බල ප්‍රදේශයේ තියෙන පොර පාසල් ටික අරගෙන දරුවෝ සංඛ්‍යාවෙන් බෙදලා ගත්තාම අපි වෙන් කරලා තියන මුදල් ඔය ඉල්ලුම සපුරා ගලන්න ප්‍රමාණවත්ද කියන කාරණය පිළබදව මට ගැටළුවක් තියනවා. අපේ ඉදිරි අනාගතය භාරගන්න ඉන්න රටේ දුවා දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඒ අයගේ මානසික සෞඛ්‍ය වෙනුවෙන් ඊට වඩා මුදලක් වෙන් කරන්න පුළුවන් නම් මීට වඩා සාර්ථක අයවැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වන බව මම විශ්වාස කරනවා. මම අයවැය සම්බන්ධයෙන් මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අයවැය සම්බන්ධයෙන් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තියන මුදල් ප්‍රමාණවත් නොවන බවයි ප්‍රකාශ කරන්න තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ක මධුභාෂණ මහතා</u>**

ගරු සභාපතිතුමණි, අපි සභාවට ඇවිල්ලා අවුරුදු 4 ක් පමණ ගත කරලා බොහෝ විට අපේ දුර කාලය තුල අපි මුහුණ දෙන අවසාන අයවැය මෙය විය යුතුයි. නවක මන්ත්‍රීවරයෙක් ලෙස ඇවිල්ලා අපි යෝජනා කරපු කාරණා බොහෝමයක් තිබුණා. නමුත් අවසානවකට වගේ විවිධ හේතු සාධක හා අභියෝග හමුවේ ඒව අපිට කරන්න බැරි උනා. ඒ වගේම මේ මොහොතේ යම් කිසි කාරණා කිහිපයක් කෙටියෙන් මතක් කරන්න කැමතියි. අපි අයවැයට අපේ අරමුණ වශයෙන්, කාරනා වශයෙන් දාලා තිබ්බට ඒවා ජයගන්න අරමුණු කරායන්න මොන වගේ ක්‍රියාමාර්ගද අරගෙන තියෙන්නේ කියලා දෙවරක් නොවේ, තෙවරක් අපි සිතා බැලිය යුතුයි. බොරුවට අරමුණු දාලා අපි යන්න ඕනි මෙහෙමයි කියලා දාලා අපි ඒකට අදාලව පාරේ යන්නේ නැත්නම් අපිට ඒ අරමුණු වලට යන්න අපහසුයි. අපි මේ ගත කරන්නේ අර්බුද ගොඩක් තියෙන කාලෙක හා අර්බුදවලින් පිරිච්ච කාලෙක.ඒ වගේම අභියෝග අපිට අනාගතයෙදී එන්න පුළුවන්. අපි දන්නවා හේතු ලෙස පසු ගිය වර්ෂ වල අභියෝග ජය ගන්න අපි මොනවගේ ක්‍රියාමාර්ගද ගත්තේ කියලා. මේ අයවැය තුලින් සාර්ථක අයවැයක් මම දකින්නේ නැහැ. ගරු සභාපතිතුමාට ඇඟිල්ල දික්කරනවා නෙමෙයි. ඒ ඒ ක්ෂේත්‍ර සම්බන්ධව දක්ෂ අය හා යම් යම් කරණා සම්බන්ධව ඒ විෂයට අදාළ නිලධාරින් සිටිනවා. මේ කාරණා පිළිබද දැනුමක් තියන විෂය ප්‍රමාණිකයින්ගෙන් අදහස් ටිකක් අරගෙන අපිට මේ තත්වය යටතේ කලමනාකරණය කරන්න පුළුවන් වගේ දේවල් ටිකක් මෙම අයවැයට එකතු වුණා නම් වඩා වටිනවා. මේ බොහෝ මන්ත්‍රීවරු කතා කලා වගේ මේ ආමන්ත්‍රණ කරන්න ලැබෙන අවසාන අවස්ථාව නිසා ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා බොහෝ විට ඔහුට හැකි සෑම අවස්ථාවකදිම අපේ අවශ්‍යතා හා මහජන නියෝජිතයෝ හැටියට ගමට ගිහිල්ලා අපිට පක්ෂ භේදයකින් තොරව වැඩ කිරිමට අවස්ථාව සලස්වා දිම පිළිබඳව. ඒ වාගේම සියළුම මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙනවා අපිට ලැබිච්චි ආදර්ශ වෙනුවේ. මටත් අප සියළු දෙනාටත් මේ කටයුතු පහසුවෙන් කරගෙන යාමට අවස්ථාව සලසා දුන් අපේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සහෝදර නිලධාරින් ලේකම්තුමා ප්‍රධාන සියළුම නිලධාරි මහත්ම මහත්මීන් මේ අවස්ථාවේ සිහිපත් කරනවා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අපේ නිලධාරි මහත්ම මහත්මියගෙන් ජනතා නියෝජිතයින් නොමැතිව නිලධාරී පාලනයට ඔබ යටත්ව පාලනය වන කාලයක් ආවොත් සෑම විටම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ගෞරවය රැකෙන විදියට වැඩ කරන්න කියලා. දක්ෂ .නිලධාරි පිරිසක් අපට සිටිනවා. සමහර වෙලාවට වෙලා තියේනනේ ඔවුන්ගෙන් හරියට ප්‍රයෝජනයක් ගන්නේ නැති එක. ගරු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව කියන නම අපට තැනක ගිහිල්ලා කතා කරන්න පුළුවන් විදියට ආරක්ෂා වන විදියට වැඩ කටයුතු කරන්න කියලා. ඒ වගේම සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා, හෙට අපි මෙතන නොසිටින්නත්

පුළුවන්. දේශපාලන වශයෙන් කල කිරිම් තියෙන්න පුළුවන්. නොතිබෙන්න පුළුවන්. අපි මන්ත්‍රීවරු ගණනාවකට අධිභාර වෙන්න තිබ්ච්ච අවස්ථා තිබුනා. එහිදි පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරු තේරුම් අරගෙන කටයුතු කිරිම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්තුති වෙනවා. මොකද අපි මහජනතාවට වැඩ කරන්න ඇවිල්ලා ඊට පස්සේ අපි එලියට බැහැලා ගිහිල්ලා ආපසු අවුරුදු 10 -15 කට පස්සේ අධිබාර ගෙවන්න වෙනව නම්, මහජන සේවයක් කරන්න ඇවිල්ලා වෙනත් වැරදි පුද්ගලයෝ කරපු දේවල්වලට වගකියන්න වෙනව නම්, අපිත් ඒකේ කොටස් කාරයෝ බවට පත් වෙනවා. ඒ නිසා හැමවෙලාම ඒක නිවැරදි කරගන්න තමයි කටයුතු කළේ. ඔබබතුමා කවුරු වුණත් වැරදි කළොත් අපි කෙලින් කිවුවා හැබැයි ඔබතුමාට උදව් වුන හැම වේලාවකමත් අපි පනත අනුව අවශ්‍ය කරන නිතිමය ප්‍රතිපාදන කියලා දිලා තියෙනවා. සියළුම මන්ත්‍රී තුමන්ලා එක්ක අපි කටයුතු කලා. ඒ කටයුතු කරද්දි සමහර විට වාද විවාද ඇති උනා. ඒවා දේශපාලන අර්ථයෙන් හිතලා අපි හැමෝම පුද්ගලයෝ හැටියට සමාජයට යන්න ඕනි. සභාපතිතුමා විශේෂයෙන්ම ඔබතුමා සමග පෞද්ගලිකව කිසිම ගැටළුවක් නැහැ. හැබැයි සභාවේදි කියන්න ඕනි දේ අදත් කිව්වා හෙට ලබන සභාවේදි තිබුනොත් එයත් ඔය විදියට කියනවා. ඒ නිසා අයවැය සම්බන්ධව අපි දිගටම කියපු දේ තමයි ඔබතුමාට අවුරුදු 05 ක් ආපසු හැරිලා බලන්න. මේ සංඛ්‍යා ලේඛන වල ලොකු වෙනසක් නැහැ සභාපතිතුමණි. අපට මේකෙ ලොකු වෙනසක් කරන්න බැරි උනා. අලුත් ආදායම් මාර්ග වලට යන්න බැරි උනා. මේ අයවැයෙනුත් අපට පේන්නේ මේ අයවැයත් ඒ පහේම එකතුවක් ලෙසයි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් කිත්සිරි මහතා**</u>

ගරු සභාපති තුමනි, උප සභාපති තුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. ලේකම් තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයෙන් අවසරයි. මම හිතන්නේ මම හැමදාමත් කියනවා, මේ අයවැය හදද්දී විශේෂයෙන්ම සභාපති තුමා ඇතුළු අනෙකුත් කණ්ඩායම් සමග යම් සාකච්ඡාවක් කරලා නෙමෙයි මේක හදන්නේ. මේක දැක්කම වසර ගණනාවක් තුල වැඩ කළේ කොහොමද කියලා අපිට තේරෙනවා. කොවිඩ් වසංගතය එහෙම නැත්නම් පසුගිය කාලයේ රට වැටිච්ච ආර්ථික තත්වයත් කියලා අපිට යම් යම් කාරණා ලිස්සලා යන්න පුළුවන්. හැබැයි සමහරක් විට සභාවක් හැටියට අපි සැලසුම් සහගතව හා අවශ්‍යතාවය අනුව කටයුතු කලා නම් සමහර ව්‍යාපෘති අපට මේකේ පටන් ගන්න තිබුනා, සහ සමහර සැලසුම් ක්‍රියාත්මක කරන්න අපට අවස්ථාව තිබුනා. ඒ නිසා විශාල ප්‍රාග්ධනයක් යොදවනවාට වඩා අඩු ප්‍රාග්ධනයක් වෙනත් ආදායම් මාර්ගවලට යෙදවීමේ හැකියාව ඔබ තුමන්ලාට තිබුනා. නමුත් රටේ ඇතිවෙලා තියන කොවිඩ් තත්වය ලොකයේ හැම රටකටම බලපෑවා. දකුණු ආසියාවේ තියන රටවල් වලින් ලංකාව තමයි කොවිඩ්වලින් මේ තරම් ආපස්සට ගියේ. අනිත් හැම රටක්ම කොවිඩ් ඇතුලේ පවා තමන්ගේ ආදායම වර්ධනය කර ගත්තා. පසුගිය කාලය ඇතුලත මේ රටේ ආර්ථික දේශපාලනික වශයෙන් ගත් වැරදි තීන්දු තීරණ නිසා මේ රට යම් අගාදයකට ගියා කියලා තමයි අපට කියන්න වෙන්නේ. ඒ නිසා අපිට මේක සාගතයකින්, සුනාමියකින්, සුළි සුළඟක් ඇවිල්ලා මහ ව්‍යසනයකින් මේ තත්වයට පත්වුනා නම් අපිට ඇත්තටම ඒ කාරණා කියන්න තිබුණා. මේ තත්වය තුල පවා සභාවේදී ඔබ තුමා මැදිහත් වෙලා යම් යම් ව්‍යාපෘති පිළිබදව සාකච්ඡා කලා නම් සැහෙන්න ප්‍රමාණයක් ඉදිරියට යන්න තිබුනා.විශේෂයෙන්ම සංඛපාල වසම, ඒ වගේම සුජිත් මන්ත්‍රීතුමා ඉන්න වසමේ අපිට ගල්වලවල් ආශ්‍රිතව ආදායම් මාර්ග අලුතින් ලබා ගන්න තිබුනා. ඒ නිසා තමයි මේ අයවැය ඇතුලේ විපක්ෂ නායක තුමා කිව්ව වගේ අවුරුදු පහක් ගිහිල්ලත් තවම දුරකතන අංකය වෙනස් වෙන්නේ නැතිනම් අර අපි මුලින් කිව්වා වගේ හැමදාම සංඛ්‍යා ලේඛණ එහෙම මෙහෙම කරගෙන ආපු එකක් තමයි පෙන්නේ. විශේෂයෙන්ම ඔබ තුමාගේ අයවැය පණිවිඩය ඇතුලේ ප්‍රමුඛතා ලෙස ග්‍රාමීය මාර්ග, ප්‍රජා සුභ සාධන කටයුතු ඊට පස්සේ කැලිකසල, පාරිසරික ආරක්ෂණ සැපයීම, මාතෘ හා ළමයින් සම්බන්ධව ළමා සායන. මේවා පොදු සේවාවන්. පෙර පාසල් සම්බන්ධව ගත්තොත් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව තුල පෙර පාසල් 89ක් පමණ තියනවා. ළමයි 1531 පමණ අධ්‍යාපනය ලබනවා ඒ පෙර පාසල්වල. ඒ පෙර පාසල්වල දරුවන් වෙනුවෙන් වාර්ෂිකව ලක්ෂ 16 කින්, 20 කින් පමණ සැලකිය යුතු දෙයක් කරන්න අපට පුළුවන්. අපට මතකයි, සනී රෝහණ සභාපති තුමා ඉන්න කාලේ නිල ඇඳුම්වලට ප්‍රතිපාදන දුන්නා. ආර්ථිකය බිඳවැටුණු මොහොතක අපි, ලොකු ලොකු ව්‍යාපෘතිවලට පාරවල්වලට ලක්ෂ ගණන් වියදම් කරනවට වඩා පෙර පාසල්වලට වියදම් කිරීම අනාගත ආයෝජනයක්.ආයුර්වේද සෞඛ්‍ය සායන ගැන කතා කළොත් අපි දන්නවා වැඩිහිටියන් වැඩියි. ඔවුන් අසනීප වන ප්‍රමාණය වැඩියි. ඒ නිසා වෛද්‍ය සායන සඳහා අපිට තිබුනා, වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් යොදවන්න. ඉස්සර පලාත් පාලන සතිය ක්‍රියාත්මක කලා. ඒ තුල සෞඛ්‍ය, පෙර පාසල් අධ්‍යාපන වැඩසටහන්, පුස්තකාල, ක්‍රීඩා මේ හැම එකක්ම පක්ෂ, විපක්ෂ භේදයක් නැතිව අපි හැමෝම කළා. ඒ වැඩසටහන්වලට විශාල මුදලක් වියදම් වුනේ නැහැ. ඉතාම පොඩි මුදලක් තමා වියදම් වුනේ. එළියට ගිහිල්ලා සම්පත්දායකයින්ගේ මුදල්වලින්, උදවු

අරගෙන ඊට සමීප වුනා. මුල් ගමත් එක්ක සමාජයත් එක්ක අපි බද්ධ වුනා. සමහරවිට අපි ක්‍රීඩා කරන්න ගිහින් කණ්ඩායමක් හදාගෙන, ඒ තුලින් සභාවක් ලෙස මිනිසුන්ට සේවාවක් වගේම සභාව තුල සුහදතාවයක් වර්ධනය වෙන්න කටයුතු කලා. මේවාට විශාල මුදලක් වැයවුනේ නැහැ. මන්ත්‍රීවරුන්ට ඉලක්ක භාරදීලා ඒ කටයුතු කරා නම් සාර්ථක කරගන්න තිබුනා. පසුගිය කාලය තුල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන්න යෙදවූ මෝටර්ග්‍රේඩරය සහ JCB යන්ත්‍රය පාවිච්චි කරලා අපි සමානායයෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් කොට්ඨාශයක කිලෝ මීටර් 4 - 5 ක් වැඩ කළා.එය සමානව භාවිතා කලා නම් සමහරවිට හැම මන්ත්‍රීවරයකුටම සමානායයෙන් ගම් ප්‍රදේශයේ හැම ප්‍රදේශයක්ම ආවරණය වන ආකාරයට අඩු මුදලකින් වැඩි ප්‍රමාණයක් කරන්නට තිබුණා. ඒ නිසා අපට අයවැයෙන් කාන්ති මන්ත්‍රීතුමිය කිව්ව වගේ ලක්ෂ ගණනකින් වෙන්නත් තිබුනා. පසුගිය කාලෙ කොලඹගෙආර සති පොළ ලඟ තාප්පයත් ඉදිකලා. ලක්ෂ 13 ක ගල් බැම්මක්. අපි ඉදිකරද්දි කිව්වා, දෙවන අදියර විදියට පොලොව හදන්න කියලා. හැබැයි කිව්වා, පොලව ගං වතුරට යට වෙනවා කියලා. මම දැනුවත්ව එක වතාවත් යට උනා. හැබැයි නැවත ඒ ඉදිකිරීම් කරලා, තමයි පස් කියුබ් 1000 ක් විතර දමන්න ඉල්ලුවේ. පස් කියුබ් 1000 ක් දාද්දි විශාල මුදලක් වැය වෙනවා. හැබැයි ඒ ලක්ෂ 13 මුදලින් යම්තාක් දුරට මේ පොළ සංවර්ධනය කරන්න තිබුනා. ඔබ තුමාලට මම කිව්වා එදා තුංකම පොළ කනත්තක් කියලා. ලක්ෂ 40 ගණනක් වෙන් කළා එය සංවර්ධනය කරන්න.නමුත් ඔබ තුමාට කැඩිච්ච කණුව අදටත් හදන්න බැරි උනා. තාම වෙළඳුන් ඉන්න ශාලාවේ ආවරණය මැද කණුවක් කැඩිලා ලී ටික පහත් වෙලා. අඩුගානේ ලක්ෂ ගානක් වියදම් කරපු එකේ 10,000.00 වියදම් කරලා කණුව කෙළින් කරගන්නවත් අපිට බැරි උනා. ඒ නිසා ඔබ තුමන්ලා අදටත් බලන්න පොළ දිහා. එය සභාවේ පොළක්. හැම සතියේ දවසකම, පොළ තියෙන දවස් නැතිව, බැලුවොත් තවම සුසාන භූමියක් වගේ තමයි. එහෙම කිවුවම අපි හිතුවා ඒක නිවැරදි කර ගනියි කියලා. ගොඩක් දේවල් කරන්න ඕනි නැහැ.ඔබ තුමා සතියේ දවසක ඔතනින් යනකොට ෆොටෝ ටිකක් ගහගන්න. ඔබ තුමාට පෙනේවි එහි තත්ත්වය. ඒ වගේම පල්ලෙබැද්ද පොළ යම් ඉදිකිරීම් ප්‍රමාණයක් කලා.

සභාවේ සෝෂා ....................................................

පෙර පාසල්වල උත්සව මේ දවස්වල තියනවා. සමහර පෙර පාසල්වල ළමයි 8-10 පමණ සිටින්නේ. සමහරවිට සභාව හැටියට අදාල ප්‍රදේශයේ මන්ත්‍රීතුමාට වතුර බෝතලයක් අරගෙන පෙර පාසල් උත්සවයට යන්න තිබුණා නම්.ඇත්තටම එහෙම දෙයකට මහා මුදලක් අවශ්‍ය නැහැ. අපි කියන්නේ ඒ වගේ පොඩි පොඩි දේවල්.

සභාවේ සෝෂා ....................................................

උසවි දඩ මිලියන 15 ක් ලැබිලා තියනවා. ඒව එවන්නේ නිකම් නෙවෙයිනේ. එවන්නේ පාරක් හදන්න නෙමෙයි. මෙයින් යම් මුදලක් පෙර පාසල්වල යම් යම් සුභ සාධන කටයුතුවලට වැය කරන්න. පලාත් පාලන ආයතන ඡන්දය ගැන සරත් මන්ත්‍රීතුමා කතා කළා. බොහෝ විට 99% ක්ම පලාත් පාලන මැතිවරණය තියන්න ඕනි තැනට රට ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා කල් දානවා කියන එක අහම්බයක්. ඒ නිසා බොහෝ විට මේ ක්‍රමය තුල තියන්න පුළුවන්. නමුත් එතුමාගේ අදහසක් ආවා ඒ සඳහා කෝටි 1000 ක් පමණ යනවා කියලා. මැතිවරණ කොමිසන් සභාපතිවරයාට පොඩි අවුලක් තියනවා. මොකද මෙතෙක් මැතිවරණ ඉතිහාසය තුල වැඩිම වියදම ගියේ පසුගිය මැතිවරණයේ.ඒ කෝටි 1200 ක් පමණ. කෝටි 10000 ක් කියන එක ප්‍රායෝගික නැහැ. එතුමාට අවශ්‍ය මැතිවරණය නොතියා සිටින්න. ඒ නිසා විජේදාස රාජපක්ෂ නායක තුමා ප්‍රකාශ කලේ අනිවාර්යයෙන්ම මැතිවරණයක් තියන්න වෙනවා කියලා. කොමසාරිස් පාලනයක් යටතේ මන්ත්‍රීවරු නැති කාලේ අපි දැක්කා අවුරුදු 03 ක් ඇතුලත වෙච්ච සමහරක් දේවල්. මහජනතාවට සේවය කරන්න තිබුණු මුදල් නාස්ති කරපු විදිය අපි දැක්කා. සමහර පලාත් පාලන ආයතනවල අය වැඩ තහනම් වෙලා මේ වන විට ගෙවල් වල ඉන්නවා. මහජනතාවට යන්න ඕන මුදල්.අපි කියන්නේ නැහැ, හැම නිලධාරියාම වැරදියි කියලා. හැබැයි අසීමිත ලෙස මුදල් ප්‍රමාණයක් අපතේ ගියා.ඒ නිසා පලාත් පාලන මන්ත්‍රීවරු එන එක වැඩි ද අඩු ද මොකක්ද කියන එක රජයේ ප්‍රතිපත්තියක්. නමුත් පලාත් පාලන මන්ත්‍රීවරයෙක් වශයෙන් පක්ෂ ද විපක්ෂ ද නෙමෙයි විශාල මුදලක් ගමට යන්න තිබූ අවස්ථාව තමයි මගහැරුනේ. ඒ නිසා පලාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් විශේෂයෙන් තියන්න ඕනි කියන තැන තමයි ඉන්නේ. ගරු සභාපති තුමනි, පසු ගිය කාලය තුල අපි කටයුතු කල අවුරුදු 05 විශේෂයෙන්ම ඔබ තුමාට ස්තුති කල යුතුයි. වීථි ලාම්පු 10 ක් දුන්නා. විශේෂයෙන්ම අමිල සභාපති තුමාට ස්තුති කරන්න ඕනි. හේතුව ප්‍රජා ශාලාවකට විදුලිය ලබා ගැනීමේදී ඔබ තුමා හා අමිල සභාපතිතුමා යන දෙදෙනාම කැපවීමෙන් කටයුතු කලා. ඒ සඳහා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනි. හැබැයි සභාපති තුමා ඔබ මොනවා කිවුවත් පලාත් පාලන මන්ත්‍රීවරු වශයෙන් අපි ගන්නා තීන්දු තීරණ හැම එකන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අනාගතයේදී වලංගු නොවුනට පලාත් පාලන මන්ත්‍රීවරුන්ට වලංගු නොවුනට හැම පලාත් පාලන මන්ත්‍රීවරයෙකුටම අපි ගන්නා තීන්දු වලංගු වෙනවා. අපි වැරදි තීන්දුවක්

ගත්තොත් අනාගතේ දවසක අපිට විතරක් නෙමෙයි අපේ දරුවන්ට පවා ගෙවන්න වෙනවා. ඒ නිසා මේ සභාව ඇතුලේ අවුරුදු 05 ක් යන්තම් පැන පැන ආපු කාරණා කිහිපයක් තියනවා. ඒ වගේ තීන්දු ගැනීමේදී හරි පරිස්සමෙන් සභාපති තුමා. විශේෂයෙන්ම ඒවට අදාල කරුණු අපි ඉදිරිපත් කලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුලකුලසූරිය මහතා**

2023 අයවැය සාකාච්ඡාවේදි විශේෂයෙන්ම ඔබතුමා ඇතුලු කාර්යය මණ්ඩලයට ස්තිතු කරනවා මේ අයවැය සකස් කරන්නට උපරිම උත්සාහයකින් කටයුතු කිරීම ගැන. විශේෂයෙන්ම ගරු සභාපතිතුමණි මතක් කරන්නට ඕනි, ඔබතුමා අයවැයට ඇතුලත් විය යුතු කරුණු සාකාච්ඡා කරන්නට වෙනම සාකාච්ඡාවක් තිබුණා, මේ සභා ගර්භයේදීම. එදා සමහර අපේ මන්ත්‍රිවරු සිටියා. සමහරු හිටියේ නැහැ. නව ආදායම් මාර්ග හැටියට මේ අයවැය ලේඛනයට ඇතුලත් වෙලා තියන යෝජනා තුනෙන් දෙකක්ම මම ඉදිරිපත් කල ඒවා සහ එක් යෝජනාවක් මමත් සුජිත් මන්ත්‍රිතුමත් ඉදිරිපත් කල යෝජනාවක්. මේ යෝජනා අයවැය වාර්තාවට ඇතුලත් විම පිළිබදව විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ අපි මේ ඉදිරිපත් කල අයවැය, ඉතිහාසයේ පත්කල සභාවේ සිට සංවර්ධනයට අඩුම මුදලක් වැය කරන සභාවේ ස්වයං උත්පාදනයෙන් සොයා ගන්න මුදලින් වැය කරන්නට පුළුවන් වුණ අයවැයක්. ඒකට බොහෝ සාධක බලපෑවා. ඉස්සර ඉදලා මේක දිර්ඝව බලපෑවා. අපි අලුත් ආදායම් උත්පාදනය සඳහා කටයුතු කිරිමේ ප්‍රමාදයක්. ඒක අපිත්, මමත් තුන්වන වරටත් පිළිගන්න ඕනි. සභාවේ අලුත් ආදායම් වලට නොයෑම පිළිබදව ඒදා ඉදලා සිටි ලේකම්වරුන්ගේ සිට සියළුම දෙනා වගකියන්න ඕන. ඒක අපි සමානව බෙදා ගන්න ඕනි. මම හිතන්නේ මේ අයවැයට ඉදිරිපත් කරපු යෝජනා හරි ක්‍රියාත්මක කරලා, මම තවත් යෝජනා 2 ක් දුන්නා. ඒක පිළිබදව සභාපතිතුමා කාර්යයක් පැවරුව එකක්. ඒක මේ වන විට මුලික කටයුතු අවසන් කරලා තියෙනවා. මේ අයවැයෙන්වත් අපි පටන්ගන්න ඕනි.අලුත් ආදායම් මාර්ග වලට ගිහිල්ලා ඉදිරියට තව අවුරුදු 10 -15 ඉලක්කම් තුල ස්වයංව අපිට නැගිටින්න පුළුවන්, පලාත් පාලන ආයතනයක් බිහි කරන්න පුළුවන්. ඒවාගේම ගරු සභාපතිතුමණි. විශේෂයෙන් ඉල්ලිමක් කරනවා, අපි හැමදාමත් අයවැයට යෝජනා ඉදිරිපත් කලාම ඒක පිළිබදව අපි විපරමක් කරන්නේ නැහැ. ඒ විතරක් නෙමෙයි. යෝජනා වලදි වැඩ පිළිවෙලක් නැහැ, ඉදිරියට යන්න. ඒක දිර්ඝ කාලිනව හැමදාමත් සිදුවන දෙයක්. ඒ නිසා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා නව අදායම් උත්පාදන මාර්ග සහ කාන්තිමන්ත්‍රීතුමිය කිව්වා වගේ ප්‍රාග්ධන ආදායම සදහා ප්‍රාග්ධන ආධාර ලබා ගැනිමට හා නඩත්තු ඒකකය සාර්ථකව ක්‍රියාත්මක කරන්නටත්, ජනතාවට අඩු මුදලකින් යම් සේවයක් කරන්නටත්, සභාවේ ආදායම් උත්පාදනය වන විදියට මේක කරන්නටත්, පුළුවන් වැඩ පිළිවෙලක් ලබන ජනවාරි මාසයේ ඉදලාම ආරම්භක කරන්න කියලා. ඒ සඳහා මන්ත්‍රීතුමන්ලා ඒ විෂයට අදාළ නිලධාරි මහතුන්,ලේකම්තුමා ඒ සියළුම දෙනා එකතු කරලා යම් කමිටුවක් විදියට වෙන වෙනම භාරදිලා මේ සඳහා ක්‍රියාත්මක වු වැඩපිළි වෙලක් හදන්න කියලා ඉල්ලිම කරන අතර ගරු සභාපතිතුමණි, මම දිර්ඝව කතා කරන්නේ නැහැ. මේ අයවැය ලේඛනය තුල අපිට යම් මුදලක් ඉතිරි වෙන්නට තිබුණා. වර්ථමාන ආර්ථික උද්දමනයක් එක්ක තුන්ගුණයකින් විතර වියදම් වැඩි වෙලා, ඊට සාපේක්ෂ වශයෙන් ආදායම් තමා වැඩි වෙලා නැත්තේ. නමුත් අද වන විට වරිපනම් ගෙවන පුදගලයාගේ වරිපනම් ඒකකයේ මිල වැඩි කරනවා වෙනුවට දියුණු ගම්මාන බවට පත් වෙච්චි ප්‍ර දේශ තියනවා. වරිපනම් ඒකක සංඛ්‍යාව වැඩි කරාම බලාපොරොත්තු වු ඉලක්කයට ගිහිල්ලා, එය පරිපුරක ඇස්තමේන්තුවක් මගින් හරි, ඒ සංවර්ධනයට මාසයක් ඇතුලත හරි වැඩි මුදලක් ඒ ඒ කොට්ඨාශවලට ලබා දිමට පුළුවන් වැඩ පිළිවෙලකට යමු. ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයෙන් හා නිලධාරිගෙන් සහයෝගයන් අපි බලාපොරොත්තු වෙනවා .ගරු සභාපතිතුමණි හැමෝම කථා වුණා අවසාන සභාව කියලා. අවසාන සභාව වෙන්න නම් විසුරුවන්න ඕන.තව සභා දෙකක් තියනවා මම හිතන්නේ. අපිත් මැතිවරණයට සුදානම්. මොකද ශ්‍රි ලංකාවේ දේශපාලන පක්ෂ විදියට පලමුවන පියවර තැබුවා ශ්‍රි ලංකා පොදු ජන පෙරමුනත්. මේ වෙන කොට පලාත් පාලනය සඳහා ඉල්ලුම් පත්‍ර කැදවලා තියෙනවා. මොකද මැතිවරණ කල් දැමීම පිළිබදව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කැමැත්ත තිබුනට මහින්ද රාජපක්ෂ තමැතිතුමාගේ කාලේ තිබුණේ හැමදාම කලින් මැතිවරණ තියන සංස්කෘතියක්.

සභාවේ සෝෂා ...................

මොකද මේ රටේ හැම දෙයක්ම දන්නේ අනුර කුමාර දිසානායකයි, ඔහුගේ පරම්පාරවයි, ජනතා විමුක්ති පෙරමුණේ අයයි විතරයි. ඔහුගේ වැඩේ කේහෙ හරි කුණු ගොඩක් එපා වෙනකම් අවුස්ස අවුස්ස ඉදලා ඊට පස්සේ යනවා තව කුණු ගොඩක් හොයාගෙන. ඒක ආපහු අවුස්සනවා. ඒකයි ඔබතුමාලගේ ප්‍රතිපත්තිය. මොකද ගරු සභාපතිතුමණි කවුරු හරි හිතාගෙන ඉන්නවා නම් ඊලග පාර අපි තමයි එන්නේ කියලා ඒත් ක්‍රියාත්මක කරන්න වෙන්නේ මේ අය වැයම තමයි.

සභාවේ සෝෂා ....................

ඒ වගේම අපේ සභාවට අළුතින් පත්වෙලා ආව අපේ අලුත් මන්ත්‍රීතුමියටත් සුභ ප්‍රාර්ථනා කරන ගමන් 2023 අයවැයේදී අපි ඉලක්කගත කාල සටහනකට අනුව ඒ ආදායම් ටික ලංකර ගෙන මේ බල ප්‍ර දේශයේ ජනතාවට පොදුවේ සේවය කරන්නට හැකි ශක්තිය ධෛර්ය සියළුම මන්ත්‍රීවරුන්ට හා ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයට ලැබේවා. ලබන්නාවූ 2023 වර්ෂය සෞභාගයමත් වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු සභාපති සුරන්ත විරසිංහ මහතා</u>

2023 වර්ෂය සඳහා සකසන ලද අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මම හිතන්නේ ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රිතුමන්ලා බහුතර පිරිසක් අදහස් ප්‍රකාශ කලා. ඒ ඇතුළත අපේ අමිත් මන්ත්‍රීතුමා අදහස් දැක්වුවා, එක සති පොලක් සංවර්ධනය කරන්න ලක්ෂ 10,10 වෙන් කරනවාට වඩා. කියන කාරණයේදි අපි පල්ලෙබැද්ද සතිපොල අපි සංවර්ධනය කලා අපිට පුළුවන් ප්‍රමාණයෙන් බිම සැකසුවා. තුංකම සතිපොලේ අපිට උපුල් මන්ත්‍රීතුමා සඳහන් කල අඩුපාඩුව තාම තියෙනවා. ඒක මඩවගුරක්ව තිබූ සතිපොලක්. අද පාරිභෝගිකයන්ට ඇවිත් ඒ කටයුතු කරගන්න පුළුවන් මට්ටමට බිම හැදුවා. තව හදන්න ගො ඩක් තියෙනවා. මෙතුමා කියූ ආකාරයට අපේ දැන් ඊලග අරමුණ රුපියල් ලක්ෂ 5 -5 කඩලා දෙනවාට වඩා එක සතිපොලක් සංවර්ධනය කිරිම තමයි. පනාමුර හා 42 සතිපොලවල් කඩිනමින් සංවර්ධනය කල යුතු නමුත් මෙතුමා කිව්වා වී පවතින මිලට අරගෙන සහනදායි මිලට දෙන්න පුළුවන් කියලා. එහෙම වී පවතින මිලට අරගෙන සහනදායි මිලට දෙන්න පුළුවන් හැබැයි අපිට මේ සභාවෙන් මුදල් ටික එලියට ගන්නේ කොහොමද කියන කාරණාවේ පොඩි ප්‍රශ්ණයක් තියෙනවා. මෙතුමා කිව්වා පෙර පාසල් ගැන. ඇත්තටම අදහස හොඳයි. අදහසට ගරු කරනවා. ක්‍රියාවට ගන්න ගියාම අපි හිරවෙනවා මේ නිතිමය ගැටළු සමග. මේ අයවැය තුල උනත් හිර වෙනවා.මේ අයවැය මේ නිලධාරියා හිතුමතේට හදපු එකක් නෙමෙයි. ලේකම්වරයා අප සියළු දෙනා සාකාච්ඡා කරලා තමයි හැදුවේ. ඔතන ඉදන් අපිටත් පුළුවන් චෝදනා කරන්න. යෝජනාවක් කළාම පසුවිරමේ සිටිම මහජන නියෝජිතයන් වශයෙන් මගේත් ඔබේත් වගකිම. යෝජනාවක් කලාම නිතිමය ප්‍රශ්ණයක් තියෙනවා නම් අන්න එකත් හදුනාගන්න. ඒ වගේම සංබපාල ප්‍රදේශයේ කළුගල්,පස්,කැල්සයිට්,වැලි, ව්‍යාපාරවලින් අපි මුදලක් ගන්නවා. අපිට තියන නිත්‍යානුකූල රාමුව තුල. සමහරවිට ඊටත් වැඩිය එහාටත් ගිහින් ගන්නවා. හැබැයි ඒ මුදල් මේ සභාවට ගෙනත් බඳිනවා. ඒ අයට රිසිට් එකතුත් දීලා මුදල් සභාවේ ගිණුමට වැටෙන්නේ. ඒ පිළිබදව අපි කාටවත් චෝදනා කරන්න බැහැ. සංබපාල ගල් වලවල් වල මුදල් 100% ක්ම අපි අරගෙන තියෙනවා. අනවසරෙන් කරන ඒවා නෙවෙයි අවසරයෙන් කරන ඒවාගේ. අපිට පුලුවන් තරම් මුදල් අරන් තියෙනවා. ඒ නිසා සභාවක් හැටියට මැදිහත් වෙන්න ඕන තැනදි මගේ පැත්තෙන් මම මැදිහත් වෙලා තියෙනවා. මම පොදුවේ කරුණු කිහිපයක් කතා කලේ. මම ඊට එහා කතා කරන්න යන්නේ නැහැ. අදහස්වලට ගරු කරනාවා. යෝජනාවලට ගරු කරනාවා. අපි යෝජනා මුලින් ඉල්ලුවා . යෝජනා සාකච්ඡා කරන්න සියළු දෙනා එන්න කිව්වම, අපි 29 ඉන්න ඕන තැන ඉන්නේ 10 යි. 19 ක් ඇවිත් නැහැ අපි අපේ වගකීම පැහැර හැර තියෙනවා. 2023 වර්ෂයේ අයවැය සාර්ථක කර ගන්න ගරු උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලය, එවකට විපක්ෂ නායක සමන්ත රත්නායක මහතා ඇතුලු මන්ත්‍රී කණ්ඩායම මේ වන කොට සීතා පද්මිනි මන්ත්‍රීතුමිය, ජනතා විමුක්ති පෙරමුනේ උපුල් කිත්සිරි මන්ත්‍රී පුමුඛ කණ්ඩායම සියළුම දෙනා සහයෝගය දුන්නා. අවශ්‍ය තැනදී පෙනී සිටියා. ඒක අපි ගරු කරනවා. පසුගිය වසර තුල අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියළු දෙනාම සහයෝගය ලබා දුන්නා. සභාපතිවරයා වශයෙන් ඒ සම්බන්ධව මගේ ගෞරව ස්තුතිය පුද කරනවා. 2023 වර්ෂයේ අයවැය සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිලිබද උප සභාපතිතුමා ප්‍රමුඛ සියසළු මන්ත්‍රිවරුන්ගේ සහයෝගය දායකත්වය ලබා දෙන්න. කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපේ ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම් තුමා අපේ අයවැය සකසන නිළධාරීතුමා ඇතුලු සභාව කරන අපේ නිළධාරීතුමියන් දෙපල කැපවීම් කලා දිගින් දිගටම. මේ සියළු දෙනාම අයවැය සැකසීමටත් එය ක්‍රියාත්මක කිරීමටත් පසුගිය වසරේ දායකත්වය ලබා දුන්නා. 2023 වර්ෂයේ තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම සහ වගකිම් ඉටු කිරීමට සහයොගය ලබා දිමට කටයුතු කරන ලෙස සියළු දෙනාගෙන්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. 2023

වර්ෂයේ අයවැය සඳහා මත 2 ක් ඉදිරිපත් වුණා. ඒ නිසා ඡන්ද විමසීමකට යා යුතුයි.ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මහ සභාවට අවස්ථාව ලබා දෙනවා.

- ඒ අනුව, ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉහත යෝජනාවට පහත පරිදි ජන්දය ප්‍රකාශ කරන ලදී.

➢ **මෙම යෝජනාවට පක්ෂව ජන්දය ලබා දුන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛණය - :**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ.චන්ද්‍රසිරි මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.ඒ.පේමාවතී මහත්මිය

➢ **මෙම යෝජනාවට විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛණය - :**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. උපුල් කිත්සිරි මහතා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. නන්දසේන මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එල්.ඒ. කාන්තිලතා මිය.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා

➢ **මෙම යෝජනාවට අදාළව ජන්දය දීමෙන් වැළැකී සිටි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛණය-:**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.මල්ක මධුභාෂණ මහතා

➢ **මෙම යෝජනාවට අදාළව ජන්දය විමසන අවස්ථාවේ සභා ගැබේ නොසිටි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛණය-:**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය

- **මෙම යෝජනාවට අදාළව ඡන්දය විමසන දිනයේ සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛණය-:**
  නැත.

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>

ඒ අනුව 2023 වර්ෂයේ අයවැය ලේඛනයට පක්ෂව ඡන්ද 18 කුත් විරුද්ධව ඡන්ද 05 කුත් වැලකී සිටි ඡන්ද 01කුත් ලෙස සටහන් වෙනවා.

- **ඒ අනුව, 2023 වර්ෂට අදාලව සකස් කරන ලද අයවැය සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට වන යෝජනාවට අදාළව ඡන්ද විමසීමේදී, යෝජනාවට පක්ෂව වැඩි ඡන්ද භාවිතා වූ බැවින් මෙම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

- **ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව.**

2023 වර්ෂය සඳහා අයවැය පිලිබඳ විශේෂ සභාව මෙතනින් නිමා කරනු ලබනවා. අද පැමිණ පූර්ණ සහයෝගය දුන් උප සභාපතිතුමා ඇතුලු සියළු මන්ත්‍රීතුමියන්ලාට හා සහයෝගය ලබානොදුන් වුවත් අදහස් ප්‍රකාශ කල පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ට ලේකම්තුමා ඇතුළු සියලු නිළධාරීන්ට ගෞරවය පුද කරනවා.

2022.12.19 වන දින පැවති විශේෂ මහ සභාව පස්වරු 12.00 ට පමණ නිමාවට පත්විය.

සුරන්ත වීරසිංහ,
ගරු සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.